## බලංගොඩ ප්‍රාදේශීය සභාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 පෙබරවාරි 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 අගෝස්තු 21 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව බලංගොඩ ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට බලංගොඩ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගණුම්කරණ අඩුපාඩු

(අ) ආදාහනාගාරය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් රු.1,030,000 ක්,ණය ගිණුමට බැර කල යුතු වුවත් අංක 3.81 සහ 3.82 දරණ අය ශීර්ෂ වලට බැර කර තිබුණි.

(ආ) උපලේඛණය අනුව සභාව සතු මෝටර් රථ වල වටිනාකම රු16,400,000 ක් වුවත් රු.7,705,250ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වත්කම් රු.8,694,750 ක් අඩුවෙන් ප්‍රාග්ධනීත කර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 27,350,900 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,382,684 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,903,683 විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) වරිපනම් හා බදු | 551 | 384 | 265 |
| (ii) බදු කුලී | 140 | 118 | 74 |
| (iii) බලපත්‍ර ගාස්තු | 27 | 27 | 109 |
| (iv) වෙනත් ආදායම් | 38,409 | 31,966 | 28,620 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 4,563,323 |
| (ii) | මුද්දර ගාස්තු | 8,413,240 |

2.2.3 කඩ කාමර කුලී

2011 සහ 2011 ට පෙර වර්ෂ වෙනුවෙන් වේලිඔය පැරණි කඩකාමර අංක 01 සහ අංක 03 න් අයවිය යුතු එකතුව රු.19,938 ක් වූ හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 බිම් බදු කුලී

2011 දෙසැම්බර් 06 දින වන විට සභාව සතු කුලියට දී ඇති මූකලාන බිම්කට්ටි වලින් අයවිය යුතු රු.50,500 ක කුලී මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

2.3 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

රත්නපුර දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ තීරණය පරිදි බලංගොඩ ප්‍රාදේශීය ලේකම්වරයා භාරයේ තිබූ කල් තොට ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පැවති ට්‍රැක්ටර් රථ සහ උපකරණ විෂයයන් 31 ක් 2010 අගෝස්තු 23 වන දින සභාවට භාර දී තිබුණද එම වත්කම් 2011 දෙසැම්බර් 31 වන දින දක්වාම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්ක්‍රියව පැවතුනි.

3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමණාකරණය